# රසායන වාජීකරණ




දෝෂ,ධාතු මල ආදීන්ගේ සමතාවයත්, සම ක්‍රියාවලියත් ප්‍රසන්න ආත්ම, ඉන්ද්‍රිය, මනස ද පවත්වාගෙන යන්නා නීරෝගී පුද්ගලයා වන්නේය යි. පසුගිය ලිපියෙන් සඳහන් කළෙමි. මෙම තත්වය අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා ගෘහ ජීවිතය ගත කරන්නටත් විශේෂිත වූ උපදෙස් රැසක් උගන්වා ඇත්තේය. ඒවා 1. රසායන 2. වාජීකරණ වශයෙන් හඳුන්වනු ලැබේ. ජරා ව්‍යාධි නාශක ගුණය රසායන නමින් ඉගැන්වේ. එම ඖෂධ හා ප්‍රතිකාර රසායන ඖෂධ හා රසායන ප්‍රතිකාර නම් වෙති.

නිරෝගී ජීවිතයක් ගත කරමින් ලිංගික ගෘහ ජීවිතය සංවරව පවත්වාගෙන යමින් නීරෝගී
වාසනාවන්ත දරුවන් ලබමින් සාර්ථක ජීවිතයක් සඳහා වාජීකරණය අවශ්‍ය වන්නේය. එම ඖෂධ වාජීකරණ ඖෂධ නම් වෙත් ප්‍රතිකාර වාජීකරණ ප්‍රතිකාර නම් වෙත්.

රස - අයන රසායන නමි. රස, ආහාර රසයි. අයන යනු මාර්ග යි. මුඛයෙත් ගත් ආහාරය මැනවින් දිරවා පාකයට පත්ව ආහාර රස සෑදී ශරීරස්ථ ස්‍රෝතෝ මාගී - (නාල) මගින් ශරීරය පුරා ගෙන යමින් ශරීරය පෝෂණය කරන්නේය. යම් විටෙක කුමන හේතුවක් නිසා හෝ මේ නාලමාගී ඇවිරුණ හොත් ආහාර රස ගෙන යා නොහැකි වන්නේය. විවිධ හේතු නිසා විවිධ තැන්හි ඇතිවන මේ අවස්ථා රෝග වශයෙන් හඳුන්වනු ලබන්නේය. එනිසා ස්‍රෝතස් මාර්ග තුලින් රස ගෙන යාමට හැකිවන පරිදි ස්නේහ ස්වෙද උපක්‍රම පූර්වකව නස්‍ය, වමන, විරේක, නිරූහ අනුවාසන යන පංචකර්ම උපක්‍රම යොදා ශෝධිත වූ ශරීරියට රසායන, වාජීකරණ ප්‍රතිකාර යෙදීමෙන් මැනවින් රසායනයත්, වාජීකරණයත් සිදුවන්නේය.



රසායන ඖෂධ වල රසායන ගුණ ප්‍රමුඛව වාජිකරණ ගුණ ද ඇත්තේය. වාජීකරණ ඖෂධ වල වාජීකරණ ගුණ ප්‍රමුඛව රසායන ගුණ ද ඇත්තේය. ගුණයන්ගේ ප්‍රමුඛත්වය අනුව නම යෙදී ඇත. ඒ කෙසේ වුවත් රසායනයෙන් තොරව වාජීකරණය සිදු නොවන්නේය.

රසායන ප්‍රතිකාර බොහෝය. ඒවා අතුරෙන් ශ්‍රේෂ්ඨ වන්නේ ආචාර රසායනයි දස අකුසල් නොකරණ දස පුණ්‍යක්‍රියාවන්හි නිරත වන පුද්ගලයා නිරන්තරයෙන්ම ආචාර රසායනය පරිශීලනය කරන්නේය. ඔහුට මුඛ මගින් රසායන ඖෂධ ගැනීම අවශ්‍ය නොවන්නේ ය. ඔහු නියතයෙන්ම සැපවත් නීරෝගී, දීඝායුෂ ලබන්නේය.

ආත්මවත් පුද්ගලයා නිතර වාජීකරණ ද්‍රව්‍යයන් සේ-වනය කළ යුතුය. ධර්මය, අර්ථය, ප්‍රීතිය, යසස යන මේවා වාජීකරණයට අයත් වන හෙයින් හෙවත් වාජීකරණය පෙරටුකොට ඇති හෙයිනි. එහි ගුණයෙන් (ධර්ම, අර්ථ, ආදීහු) දරුවන්ගේ ඇසුරට ද යෙති. අධික හර්ෂය උපදවාලන ස්ත්‍රිය තරම් ශ්‍රේෂ්ඨ වන වෙනත් වාජීකරණ බෙහෙතක් ලෝකයෙහි නැත්තේය. මනා රූ සපුවෙන් යුක්ත වූද, යෞවනයෙහි සිටියා
වූ ද, යහපත් ලලනා ලක්ෂණයන්ගෙන් හෙබියා වූ ද අවනත වන්නා වූ ද රතිශාස්ත්‍ර විෂයෙහි නිපුණා වූ ද, ස්ත්‍රිය අති ශ්‍රේෂඨ වාජීකරණය යි දන්නේය.

සතුට සත්වයා සමීප කරවන අතර නොසතුට හෙවත් තරහව සත්වයා ඈත් කරන්නේය. එහෙයින් සතුට නොමැති විට රසායන ය හා වාජීකරණය නොලබන්නේය. එහෙයින් රසායන, වාජීකරණ ඖෂධ භාවිත කරන්නවුන් සතුට වගා කරමින් පසුවිය යුතු වන්නේ එය ජීවිතයේ පරම ධනය ද වන හෙයිනි.

(-සන්තුට්ඨී පරමම් ධනම්")

වෛද්‍ය ගාමිණී විජේසිංහ
23/45, දියවන්නා උද්‍යානය
පාගොඩ පාර, නුගේගොඩ

## ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම "මං මාරුවක්" සැලසුම් කළ සිසිරට මෙරටදී පශ්චාත් උපාධියක්



අපගේ "සන්නස පිරිවරෙහි" සිසිර දිසානායකට පසුගිය දා මෙල්බර්න් නුවර මොනෑෂ් සරසවියෙන් "මාස්ටර් ඔෆ් ට්‍රැෆික් " (MASTER OF TRAFFIC) පශ්චාත් උපාධිය පරිනමන ලදී. බාහිර සිසුන් වශයෙන් ලොවෙහි වෙනත් රටවල්වල සිට පවා හදාරන මෙම උපාධිය මෙවර සම්පූර්ණ කළේ සයදෙනෙකු පමණකි.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පූර්ණ සාමාජිකයෙකු වන සිසිර වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකි. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ දිගු කළක් සේවය කළ ඔහු මෙරටට සංක්‍රමණය වන කාලයේදී මාර්ග සංවර්ධන අධිකාරියේ, අවිස්සාවේල්ල කොට්ඨාශයේ විධායක ඉංජිනේරුවරයා වශයෙන් කටයුතු කළේය. මහා මාර්ග හා පාළම් ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ අත්දැකීම් අතරින් කැළණිය ගඟ හරහා ඉදිකළ කඩුවෙල පාලමත්, නාවලපිටිය " සංගිලිපාලම මාර්ගයත් විශේෂයෙන් සඳහන් කළ හැකිය. මාර්ග සැලසුම් කිරීම් අතරින් කොළඹ " කටුනායක අධිවේගී මාර්ගය සඳහා පෑලියගොඩ ප්‍රදේශයේ ඉදිකිරීම් සැලසුම් කළ "මංමාරුව" (INTERCHANGE) කැපී පෙනෙන්නේ එය ශ්‍රී ලංකාවේ මුලින්ම සැලසුම් කළ මංමාරුව වන නිසයි.
සිසිර දැනට මෙරට "වික් රෝඩ්ස්" ආයතනයේ මාර්ග ආරක්ෂක ව්‍යාපෘති (ROAD SAFETY PROJECTS) කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකි. අවිස්සාවේල්ල සීතාවක මහා විද්‍යාලයේ සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන ඔහු ආරම්භයේ පටන්ම " සන්නස" මාසිකයට ලිපි හා සිතුවම් සමපාදනය කරනා අතර මව් බිමේ දී මෙන්ම මෙහිදී ද ගීත රචනයෙන් ද කලාවට දායකත්වය සපයයි.

"සන්නස" අපි සිසිරගේ අනාගතයට සුබ පතන්නෙමු.

සන්නස

රාජ්‍ය සම්මාන ලාභී තරංග දන්දෙනිය මෙහෙය වන
චින්තන රංග පාසල
විධාබර එදින්එදා ජීවිතයට නැවුම් බවක්
ප්‍රායෝගික සහ න්‍යායාත්මක දැනුමක්
වේදිකාව පමනක් නොව
ගුවන්විදුලිය සහ රූපවාහිනි මාධ්‍යයන්හි ද පරිචයක් ලබන්නට
රංගනය
පෙළ රචනය
රූප රචනය
අධ්‍යක්ෂනය
සහ
මාධ්‍යය තාක්ෂණය
ඇතුලු අනෙකුත් අනුෂාංගික අංගයන් ද
විෂය ප්‍රවීනයන්ගේද සහභාගිත්වයෙන් ඉගෙන ගන්නට
අගෝස්තු මස සිට ඉරුදින උදෑසන
Black Flat Community Centre
Cnr Waverley and Springvale Roads
Mel Ref 71C4
ඇමතීම් තරංග 0433707241
dan.thara@yahoo.com
Advanced Certificate (Television Production & Video Technology) National Youth Centre
Certificate (Radio Production & Script Writing) SLBC
Advanced Diploma (Theatre & Drama) Tower Hall Theatre Foundation,
B.A (Hons) (Theatre & Drama) University of Kelaniya
M. A. by Research (Theatre & Drama) La Trobe University

Well experienced teacher at Noble Park
offers tution in
MATHEMATICS AND SINHALESE
to 1-8 level students.
Contact : Shirley
9546 0979 or 0421 903 572